# ආරම්භක පිළිවෙත

පූජාප්‍රසාදිතුමා: ✠ පියාණන්ගේද, පුත්‍රයාණන්ගේද, ශුද්ධාත්මයාණ්ගේ ද නාමයෙන්,
ජනතාව : ආමෙන්.

පූජාප්‍රසාදිතුමා: අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වරප්‍රසාදයත්, දෙවි පියාණන්ගේ ප්‍රේමයත්, ශුද්ධාත්මයාණන්ගේ සහභාගිකමත් ඔබ සියල්ලන් සමඟ පවතීවා.
ජනතාව : ඔබ සමඟ ද පවතීවා.

පූජාප්‍රසාදි : ස්වාමින් වහන්සේ ඔබ සමඟ වන සේක්වා.
ජනතාව : ඔබ සමඟ ද වන සේක්වා.

පූජාප්‍රසාදි : සහෝදර සහෝදරියෙනි, මෙම දිව්‍ය පූජා යාගය සිදු කිරීමට අප නිසි ලෙස සූදානම් වන පිණිස අපි අපේ පව් සිහිකර කමාව අයැද සිටිමු.
ජනතාව : සියලු බලැති දෙවියන් වහන්සේට ද, සහෝදර සහෝදරියෙනි ඔබට ද, මා පව් කළ බව කියමි. සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන් සහ අතපසු කිරීමෙන් බොහෝ පව් කළෙමි. ඒ මාගේ වරදින් ය. මාගේ වරදින් ය. මාගේ මහත් වරදින් ය. එහෙයින් නිත්‍ය කන්‍ය මරිය තුමිය ද සියලු සුරදූතයන් හා ශුද්ධවන්තයන් ද මාගේ සහෝදරවරුනි, ඔබ ද මා උදෙසා අපගේ ස්වාමින් වන දෙවියන් වහන්සේට යාච්ඤා කරන මෙන් අවනතව ඉල්ලා සිටිමි.

පූජාප්‍රසාදි : සියලු බලැති දෙවියන් වහන්සේ අපට කරුණාකර අපගේ පව් කමා කර සදා ජීවනයට අප පමුණුවන සේක්වා.
ජනතාව : ආමෙන්.

පූජාප්‍රසාදි : ස්වාමිනි, කරුණා කළ මැනව.
ජනතාව : ස්වාමිනි, කරුණා කළ මැනව.
පූජාප්‍රසාදි : ක්‍රිස්තුනි, කරුණා කළ මැනව.
ජනතාව : ක්‍රිස්තුනි, කරුණා කළ මැනව.
පූජාප්‍රසාදි : ස්වාමිනි, කරුණා කළ මැනව.
ජනතාව : ස්වාමිනි, කරුණා කළ මැනව.

පූජාප්‍රසාදි : ස්වර්ගයෙහි දෙවියන් වහන්සේට මහිමය වේවා.
ජනතාව : මෙලොවෙහි උන්වහන්සේගේ දයාව ලත් දනන් හට සාමය

වේවා. දෙව් ස්වාමිනි, ස්වර්ගීය රජාණනි, සියලු බැලැති දෙව්පියාණනි, අපි ඔබට ප්‍රශංසා කරමු. ඔබගේ ගුණ වර්ණනා කරමු. ඔබට වන්දනා කරමු. ඔබගේ මහිමය ප්‍රකාශ කරමු. ඔබගේ මහත් මහිමය නිසා ඔබට ස්තුති කරමු. ඒකජනිත පුත්‍ර වූ ස්වාමිනි, ජේසු ක්‍රිස්තුනි, දෙව් ස්වාමිනි, දේවාජබාලකයාණනි, පියාණන්ගේ පුත්‍රයාණනි, ලොවේ පව් හරින ඔබ අපට කරුණා කළ මැනව. ලොවේ පව් හරින ඔබ අපගේ යැදුම පිළිගත මැනව. පියාණන්ගේ දකුණු පසෙහි වැඩ සිටින ඔබ අපට කරුණා කළ මැනව. ශුද්ධාත්මයාණන් සමග දෙව්පියාණන්ගේ මහිමයෙහි වැඩ වසන්නාවූ ජේසු ක්‍රිස්තුනී, එකම ශුද්ධවූ තැනැන් වහන්සේ ඔබය. එකම ස්වාමීන් වහන්සේ ඔබය. එකම පරමෝත්තමයාණන් වහන්සේ ඔබ ය. ආමෙන්.

පූජාප්‍රසාදි : අපි යාච්ඤා කරමු. (පොදු යැදුම)

සර්වබලධාරී දෙව් සමිඳුනි,
ඔබවහන්සේගේ පිතෘක ප්‍රේමය කිසි විටෙක නිෂ්ප්‍රභා කළ හැකි කවරෙක් වන්නේ ද! සියළු අනතුරු සහිත මාර්ගයන් අපෙන් දුරුකර අපේ දෛනික කාර්යයන එලදායි වන්නට සළසන මෙන්, අපි ඔබවහන්සේගෙන් අවනතව අයැද සිටිමු.

මෙකී දේ ඔබ හා ශුද්ධාත්මයාණන් සමග එකම දෙවියන්ව සදහටම වැඩසිටින්නා වූද රජකම් කරන්නාවූද, ඔබගේ පුත්‍රයාණන් හා අපගේ ස්වාමින් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උදේසාම අපට ලැබේවා. ආමෙන්.

ජනතාව : ආමෙන්.

# දේව වාක්‍ය මෙහෙය

- පළමුවන කියැවීම අවසානයේදී

කියවන්නා : දේව වාක්‍යය එසේය.
ජනතාව : දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

- පිළිතුරු ගීය

- දෙවන කියැවීම අවසානයේදී

කියවන්නා : දේව වාක්‍යය එසේය.
ජනතාව : දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

- සාධුකාරය

- සුවිශේෂය

පූජාප්‍රසාදිතුමා: ස්වාමීන් වහන්සේ ඔබ සමඟ වන සේක්වා.
ජනතාව: ඔබ සමඟ ද වන සේක්වා.

- සුවිශේෂය කියැවීම ආරම්භයේදී

පූජාප්‍රසාදිතුමා: සුවිශේෂක ________ තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය තම් මෙසේය.
ජනතාව : ස්වාමිනි ඔබට මහිමය වේවා.

- සුවිශේෂය කියැවීම අවසානයේ දී

පූජාප්‍රසාදිතුමා: ස්වාමීන් වහන්සේගේ සුභාරංචිය එසේ ය.
ජනතාව : ක්‍රිස්තුනි, ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

- දේශනය

- විශ්වාස ලක්ෂණය

එකම දෙවියන් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි. / අහස හා පොළොවද පෙනෙන නොපෙනෙන සියල්ල ද මවා වදාළ සියලු බලැති පියාණන් කෙරෙහි විශ්වාස කරමි.

දෙවියන් වහන්සේගේ ඒක ජනිත පුත්‍රයාණන් ද එකම ස්වාමීන් ද වන ජේසු ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහිද විශ්වාස කරමි. / උන්වහන්සේ සැම කලට ම පෙර පියාණන්ගෙන් ජනිත වූ සේක.

උන්වහන්සේ දෙවියන්ගෙන් දෙවියෝ ද ආලෝකයෙන් ආලෝකය ද සැබෑ දෙවියන්ගෙන් සැබෑ දෙවියෝ ද වන සේක. / ජනිත වූ නමුත් මවනු නොලැබ පියාණන් සමග එකම භවත්වය ඇතිව උන්වහන්සේ වැඩ සිටින සේක.

උන්වහන්සේ හේතු කොටගෙන සියල්ල මවනු ලැබුවේය. / මිනිස් අප උදෙසා ද අප ගැලවීම උදෙසා ද උන්වහන්සේ ස්වර්ගයෙන් බැස වදාළ සේක.

ශුද්ධාත්මයාණන් වහන්සේගේ අනුභාවයෙන් කන්‍යා මරියාවන්ගෙන් මිනිස් බව ගෙන උන්වහන්සේ මනුෂ්‍යයා වූ සේක. / තවද උන්වහන්සේ අප උදෙසා පොන්සියුස් පිලාතු යටතේ කුරුසියෙහි ඇණ ගසනු ලැබ, මරණ වේදනා විඳ, උකුත් වී තැන්පත් කරනු ලැබූ සේක.

ශුද්ධවූ ලියවිලි පරිදි උන්වහන්සේ තුන් වනදා උත්ථානවූ වූ සේක. / උන්වහන්සේ ස්වර්ගාරෝහණව පියාණන්ගේ දකුණු පසෙහි වැඩ සිටින සේක.

ජීවතුන් ද මළවුන් ද විනිශ්චය කරන්නට උන්වහන්සේ මහිමාන්විතව නැවත වඩින සේක. / උන්වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නොමැත්තේය.

පියාණන් වහන්සේගෙන් හා පුත්‍රයාණන් වහන්සේගෙන් හා නික්මෙන සමිඳාණන් ද ජීවදායකාණන් ද වූ ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි ද විශවාස කරමි. / උන්වහන්සේ පියාණන් ද පුත්‍රයාණන් ද සමග එකම වන්දනාවන් මහිමයන් ලබන සේක.

උන්වහන්සේ දිවැසිවරුන් මගින් කථා කළ සේක. / අපෝස්තුළුවරුන්ගෙන් පැවත එන එකම ශුද්ධවූ කතෝලික සභාව කෙරෙහි ද විශවාස කරමි.

පව් කමාව සඳහා එකම ප්‍රසාද ස්නාපනයක් ඇති බව අදහා ගනිමි. / තවද මළවුනගේ නැවත නැගිටීම ද මතු පැමිණෙන සදා ජීවනය ද බලාපොරොත්තු වෙමි. ආමෙන්.

- විශ්වාසිකයන්ගේ යැදුම්

# ස්තෝත්‍ර යාගික පිළිවෙත

- පඬුරු පිදීම

පූජාප්‍රසාදිතුමා: සහෝදරවරුනි, මාගේ සහ ඔබගේ යාගය සියලු බලැති දෙවි පියාණන් වහන්සේට ප්‍රසන්න වන පිණිස යාච්ඤා කරන්න.

ජනතාව: ස්වාමින් වහන්සේගේ නාමයට ප්‍රශංසාවත් මහිමයත් අත්වනු සඳහා ද, අපටත් තමන් වහන්සේගේ මුළු ශුද්ධ වූ සභාවටත් ප්‍රයෝජන වනු සඳහා ද ඔබගේ හස්තවලින් ඔවුන් වහන්සේ මේ යාගය පිළිගන්නා සේක්වා.

පූජාප්‍රසාදිතුමා: සදාතන දෙවි ස්වාමිනි,
ඔබවහන්සේගේ පිතෘක ප්‍රේමය කෙරෙහි විශ්වාසය තබන අපි, මෙම පුද පඬුරු ද රැගෙන ඔබවහන්සේ වැඳ පුදා ගන්නට මෙහි පැමිණියෙමු. ඔබවහන්සේගේ වරප්‍රසාදයන් බහුලව අප වෙත දානය කළ මැනව.
මේකී දේ අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උදෙසාම අපට ලැබේවා.

ජනතාව: ආමෙන්.

- ස්තෝත්‍ර යාගික යැදුම

පූජාප්‍රසාදිතුමා : ස්වාමින් වහන්සේ ඔබ සමඟ වන සේක්වා.
ජනතාව : ඔබ සමඟ ද වන සේක්වා.

පූජාප්‍රසාදිතුමා : ඔබගේ සිත් යොමු කරන්න.
ජනතාව : ස්වාමින් වහන්සේ වෙත යොමු කර සිටිමු.

පූජාප්‍රසාදිතුමා : අපගේ දෙවියන් වන ස්වාමින් වහන්සේට ස්තුති කරමු.
ජනතාව : එය යෝග්‍යවූ ද යුතුවූ ද ක්‍රියාවක් වන්නේ ය.

පූජාප්‍රසාදිතුමා : පරිශුද්ධ පියාණෙනි, ඔබවහනසේගේ ප්‍රේමනීය පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් සැම කල්හි ද, සැම තැන්හි ද, අප ඔබවහන්සේට ස්තුති ප්‍රශංසා කිරීම සැබැවින් ම යෝග්‍ය ය. යුතු ය. සාධාරණ ය. ගැළැවීම දායක ය. ඔබවහන්සේ සියලු දේ මැවූයේ, ඔබවහන්සේගේ වාක්‍යාණන් වන ඔවුන්වහන්සේ හේතුකොටගෙන ය. අප මුදා ගන්නා ගැළැවුම්කරුවාණන් වශයෙන් ඔබ වහන්සේ එතුමාණන් අප වෙත එවූ සේක. ඔවුන් වහන්සේ ශුද්ධාත්මයාණන්ගේ අනුහාවයෙන් මිනිස් බව ගෙන කන්‍ය මරියාවන් ගෙන් උපන්

සේක. ඔබවහන්සේගේ කැමැත්ත ඉටු කරමින් ඔවුන් වහන්සේ කුරුසියෙහි දැත් විහිදා අදික වේදනා විඳ, මරණයට පත්වී, මරණය පරාජය කොට, උත්ථානය ප්‍රකාශ කරමින් අප සැම පරිශුද්ධ ජනතාවක් වශයෙන් ඔබවහන්සේට හිමි කර දුන් සේක. එහෙයින් සුරදූතයන් සහ සියලු ශුද්ධවන්තයන් ද සමඟ අපි ඔබවහන්සේගේ මහිමය එක් හඬින් මෙසේ ප්‍රකාශ කරමු.

ජනතාව : සුවිශුද්ධය. සුවිශුද්ධය. ලෝකාග්‍ර දෙවි සමිඳාණෝ සුවිශුද්ධ ය. අහසත් පොළොවත් ඔබ වහන්සේගේ මහිමයෙන් පිරී තිබේ. ස්වර්ගයෙහි ජය ශ්‍රී වේවා. ස්වාමින් වහන්සේගේ නාමයෙන් වඩින උතුමාණෝ භාග්‍යවත් ය. ස්වර්ගයෙහි ජය ශ්‍රී වේවා.

පූජාප්‍රසාදිතුමා : එසේය ස්වාමීනි, ඔබවහන්සේ සැබැවින් ම සුවිශුද්ධ ය. සියලු සුවිශුද්ධතාවයේ උල්පත ඔබ වහන්සේ මය.

එහෙයින් ඔබ වහන්සේගේ ආත්මයාණන් ගේ අනුහාවයෙන් මේ පඬුරු පරිශුද්ධවත් කරන මෙන් අයැදිමු.

අප එසේ යදිනුයේ මේ පඬුරු අප උදෙසා, අප ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ✠ ශ්‍රී ශරීරයත් ශ්‍රී රුධිරයත් බවට පත්වනු සඳහා ය.

පූජාප්‍රසාදිතුමා : ඔවුන් වහන්සේ දුක් සහිත මරණයට සිය කැමැත්තෙන් තමන් පවරා දෙනු පෙර, පූපය රැගෙන ඔබවහන්සේට තුති පුදමින්, එය කඩා ස්වකීය ශ්‍රාවකයන්ට දෙමින් මෙසේ වදාළ සේක.

ඔබ සැම මෙයින් ගෙන අනුභව කරන්න. සැබැවින් ම මෙය ඔබ උදෙසා පවරා දෙනු ලබන මාගේ ශරීරයයි.

ජනතාව : මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි.

පූජාප්‍රසාදිතුමා: රාත්‍රී භෝජනය වැළඳූ පසුව, ඔවුන් වහන්සේ එසේම කුසලාන ද රැගෙන නැවත තුති පුදා ස්වකීය ශ්‍රාවකයන්ට දෙමින් මෙසේ වදාළ සේක.

ඔබ සැම මෙයින් ගෙන පානය කරන්න. සැබැවින් ම මෙය අභිනව වූ ද අනන්ත වූ ද ගිවිසුමේ මාගේ රුධිර කුසලානයයි. පව් කමාව සඳහා ඔබ උදෙසා ද සියලු මනුෂ්‍යයන් උදෙසා ද එය වගුරනු ලබන්නේ ය. මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න.

ජනතාව : මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි.

පූජාප්‍රසාදිතුමා: අපි විශ්වාස කරන අභිරහස ප්‍රකාශ කරමු.

ජනතාව : ස්වාමිනි, ඔබවහන්සේ උකුත් වූ සේක.
ස්වාමිනි, ඔබවහන්සේ උත්ථාන වූ සේක.
ස්වාමිනි, ඔබවහන්සේ නැවත වඩින සේක.

පූජාප්‍රසාදිතුමා : එහෙයින් පියාණෙනි, ඔවුන් වහන්සේගේ මරණය ද උත්ථානය ද සිහිපත් කරමින්, ජීවන දායක පූපය ද ගැළවීම දායක කුසලාන ද අපි ඔබ වහන්සේට පුද කරමු. ඔබ හමුවෙහි සිටිමින් ඔබට සේවය කරන්නට සුදුස්සන් වශයෙන් සැළකීම ගැන අපි ඔබවහන්සේට තුති පුදමු. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයටත් ශ්‍රී රුධිරයටත් සහභාගි වන්නා වූ අප සැම ශුද්ධාත්මයාණන් විසින් එක්සත් කරනු ලබන ලෙස අවනතව අයැද සිටිමු.

ස්වාමිනි, මුළු ලොවෙහි පැතිර පවත්නා ඔබවහන්සේගේ ශුද්ධ වූ සභාව සිහි කළ මැනව. ................ නමැති අප පොදු පියාණන් ද ..................... නමැති අපගේ රදගුරුතුමන් ද, සකල පූජක පිරිස ද සමග එම සභාව දයා ගුණයෙන් පිරිපුන් වන්නට සළසනු මැනව.

*මළවුන් සඳහා සිදු කරන පූජාවලදී මෙසේ ද කිව හැකිය.*

මෙලොවින් ඔබවහන්සේ වෙත (අද) කැඳවා ගත් (නම) .............. නමැති ඔබවහන්සේගේ දාසයා / දාසිය සිහි කළ මැනව. ප්‍රසාද ස්නාපනයේදී පාපයට නැසෙමින් ඔබවහන්සේගේ පුත්‍රයාණන්ගේ මරණයට සහභාගි වූ ඔහු / ඇය ඔවුන් වහන්සේ සමග සදා ජීවිතය සඳහා නැවත නැගිටින්නට සළසනු මැනව.

උත්ථානයේ බලාපොරොත්තුව ඇතිව මිය ගිය අපගේ සහෝදර සහෝදරියන් ද ඔබවහන්සේගේ දයානුකම්පාව කෙරෙහි විශ්වාසය ඇතිව නැසුණු අනෙකුත් සියල්ලන් ද සිහි කර, ඔබවහන්සේගේ ශ්‍රී වත මඬලේ ආලෝකය වෙතට පිළිගත මැනව. අප සියල්ලනට දයානුකම්පා කළ මැනව. භාග්‍යවත් දේව මාතාවන් වන කන්‍ය මරියාවන් ද භාග්‍යවත් අපෝස්තුළුවරුන් ද සැම කාලයන්හිම ඔබවහන්සේගේ කැමැත්ත ඉටු කරමින් දිවි ගෙවූ සියලු ශුද්ධවන්තයන් ද සමග සදා ජීවනයට සහභාගි වීමට අප සුදුස්සන් කළ මැනව. තවද ඔවුන් හා සමග ඔබවහන්සේට ප්‍රශංසා කිරීමට ද, ඔබවහන්සේගේ මහිමය වර්ණනා කිරීමට ද ඔබවහන්සේගේ පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් අපට වරම් දුන මැනව.

පූජාප්‍රසාදිතුමා: ඔවුන් වහන්සේ මගින් ද, ඔවුන් වහන්සේ සමග ද, ඔවුන් වහන්සේ කෙරෙහි ද සියලු බලැති දෙවි පියාණෙනි, ශුද්ධාත්මයාණන් හා සමග එක්ව වැඩ වසන්නා වූ ඔබවහන්සේට සකල ගෞරවයත් මහිමයත් සදහට ම අත් වේවා!

ජනතාව : ආමෙන්.

- බොදුන් පිළිවෙත

පූජාප්‍රසාදිතුමා: ගැළවීමදායක අණ පණතින් ප්‍රගුණ වී දේව උපදේශයෙන් පුහුණු වී අපි එඩිතරව මෙසේ යාච්ඤා කරමු.

ජනතාව : ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබවහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා. ඔබවහන්සේගේ රාජ්‍යය පැමිණේවා. ඔබවහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ද ඉටු වේවා. අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව. අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව. පාප අවස්ථාවනට අසුවීමට අපට ඉඩ නොදී අයහපතින් අප මුදා ගත මැනව.

පූජාප්‍රසාදිතුමා : ස්වාමිනි, සියලු අයහපතින් අප මුදාගන්නා මෙන් ද, අපගේ මෙම ජීවිත කාලයෙහි අපට සාමය දෙන මෙන් ද අපි අයැදිමු. එවිට ඔබ වහන්සේගේ කරුණාබර පිහිට ලැබ, නිරතුරුම පවින් මිදී, සියලු කරදරයෙන් සුරක්ෂිත වී අපගේ ගැළැවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නැවත පැමිණීමේ භාග්‍යවත් අපේක්ෂාවෙන් අපි වෙසෙන්නෙමු.

ජනතාව : මක්නිසාදයත්, රාජ්‍යය ද, බලය ද, මහිමය ද සදහට ම ඔබ වහන්සේගේය.

පූජාප්‍රසාදිතුමා : "සාමය ඔබ සමග තබා යමි. මාගේ සාමය ඔබට දෙමි" යි ස්වකීය ශ්‍රාවකයන් අමතා වදාළ ජේසුස් ක්‍රිස්තුස් ස්වාමිනි, ඔබවහන්සේ අපගේ පාපයන් නොතකා, ඔබවහන්සේගේ සභාවේ විශ්වාසය සළකා ඔබවහන්සේගේ කැමැත්ත පරිදි එම සභාවට සාමය ද, සමඟිය ද දානය කරන්නට කරුණා කළ මැනව. ඔබවහන්සේ සදහටම වැඩ වසන සේක. රජකම් කරන සේක.

ජනතාව : ආමෙන්.

පූජාප්‍රසාදිතුමා : ස්වාමින් වහන්සේගේ සාමය ඔබ සමග නිතරම පවතීවා.

ජනතාව : ඔබ සමග ද පවතීවා.

පූජාප්‍රසාදිතුමා: අපි එකිනෙකාට සාමය පතමු.

ජනතාව : ලොවේ පව් හරණ දේවාජබාලකයාණෙනි,
අපට කරුණා කළ මැනව.
ලොවේ පව් හරණ දේවාජබාලකයාණෙනි,
අපට කරුණා කළ මැනව.
ලොවේ පව් හරණ දේවාජබාලකයාණෙනි,
අපට සාමය දානය කළ මැනව.

පූජාප්‍රසාදිතුමා: මෙන්න දේවාජබාලකයාණෝ, මෙන්න ලොවේ පව් හරණ තැනැත් වහන්සේ, අජබාලකයාණන්ගේ භෝජනයට කැඳවීම ලද්දෝ භාග්‍යවන්තයෝය.

ජනතාව : ස්වාමිනි, ඔබවහන්සේ මා තුළට වඩින්නට මම සුදුස්සෙක් නොවෙමි. එහෙත් වචනයක් පමණක් වදාළ මැනව. එවිට මාගේ ආත්මය සුව වන්නේ ය.

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම

- බොදුනෙන් පසු යැදුම

පූජාප්‍රසාදිතුමා: ඔබ ශ්‍රී කුමාරයාණන්ගේ ශ්‍රී ශරීරයෙන් හා ශ්‍රී රුධිරයෙන් අප පොෂ්‍ය කළ දෙවි සමිඳාණනි, ඔබ වහන්සේගේ ශුද්ධාත්මයාණන් මගින් අප මෙහෙයවන ලෙස උදක්ම ඉල්ලා සිටිමු. මුවින්, වදනින් පමණක් නොව අප මුළු දිවියෙන්ම ඔබ වහන්සේට සැබෑ ප්‍රශංසාව හිමි කරමින්, ඔබ වහන්සේගේ ස්වර්ග සම්පත්තිය භුක්ති විඳුනු සඳහා අප හැම හේතුවන්තයන් කළ මැනව.
මේ කී දේ අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උදේසාම අපට ලැබේවා. ආමේන්.

ජනතාව : ආමේන්.

# සමුගැනීමේ පිළිවෙත

පූජාප්‍රසාදිතුමා: ස්වාමීන් වහන්සේ ඔබ සමඟ වන සේක්වා.
ජනතාව : ඔබ සමඟ ද වන සේක්වා.

පූජාප්‍රසාදිතුමා: සියලු බලැති දෙවි මහෝත්තමයාණන් ✠ වන පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද ඔබ ආශිර්වාද කරන සේක්වා.
ජනතාව: ආමෙන්

පූජාප්‍රසාදිතුමා: යන්න, සාමය ගෙන යන්න.
ජනතාව : දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

පූජාප්‍රසාදිතුමා: සාන්ත කුරුසියේ අඩයාලමෙන් අපගේ සතුරන්ගෙන් අප ගලවා දේවා, අපගේ දෙවි ස්වාමිනි, පිතාගෙන්, පුත්‍රයාගෙන්, ස්ප්‍රීතු සාන්තුගෙන් නාමයෙන්
ජනතාව : ආමෙන්.